**හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය (මධ්‍යම, උතුරුමැද හා නැගෙනහිර පළාත්) - 2013**

-----------------------------------------------------------------------------------------------------

හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතියේ (මධ්‍යම, උතුරුමැද හා නැගෙනහිර පළාත්) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2011 සැප්තැම්බර් 29 දින එළඹි එස්එල් - පී103 දරන ණය ගිවිසුමේ III වැවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියා විය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, මධ්‍යම හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරීන් සහ උතුරු මැද හා නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, හානි වී ගිය මාර්ග හා වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම මඟින් මධ්‍යම, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල සමාජ ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම සහ ජල ගැලීම්වලින් පීඩිත ප්‍රදේශවල තවදුරටත් හානිවීම් වැළැක්වීම් හා එමගින් බලපෑමට ලක්වූ ප්‍රදේශවල ආරක්ෂාකාරී හා තිරසාර ජීවන පරිසරයක් ප්‍රතිස්ථාපනය සඳහා දායක වීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,886 කට සමාන ජපන් යෙන් මිලියන 8,313 වන අතර, එයින් රු.මිලියන 9,161 කට සමාන ජපන් යෙන් මිලියන 7,000ක් එනම්, සියයට 84 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 1,725 කට සමාන ජපන් යෙන් මිලියන 1,313 සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වේ. 2011 දෙසැම්බර් 7 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 7 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

----------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන

ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමේන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

(ඒ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

--------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

--------------------

මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සඳහා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.4,808,999,402 ක් හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.8,737,393,220 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම, ඉකුත් කාල පරිච්ඡේදය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| වියදම් විෂයය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 4,298,601,386 | 3,442,872,615 | 7,781,552,175 |
| උපකරණ- වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - | 136,698,530 | 136,698,530 |
| බැඳීම් ගාස්තු | 2,991,781 | 831,479 | 3,823,260 |
| පොලී | 606,501 | 123,363 | 729,864 |
| පරිපාලන පිරිවැය | 506,799,734 | 306,286,298 | 814,589,441 |
| එකතුව | 4,808,999,402 | 3,886,812,285 | 8,737,393,220 |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

--------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 | |
|---|---|---|
| | ජපන් යෙන් | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2,046,601,143 | 3,028,765,031 |

| | | |
|---|---|---|
| එකතු කළා : ඌනපූරණයන් | 1,642,873,003 | 2,182,743,847 |
| විදේශ විනිමය වාසිය/ (පාඩුව) | - | (343,442,989) |
| | ------------------ | ------------------ |
| | 3,689,474,146 | 4,868,065,889 |
| අඩු කළා : ආපසු ගැනීම් | 3,269,243,026 | 4,344,499,937 |
| | ------------------ | ------------------ |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 420,231,120 | 523,565,952 |
| | =========== | ========== |

**5.** **විගණන නිරීක්ෂණ**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක හා උපාංග ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම්වල පැවැත්ම පරීක්ෂා කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ රු.139,759,109 ක් වටිනා වත්කම් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය සඳහා සිදුකර නොතිබුණි.

**6.** **මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**6.1** **අරමුදල් උපයෝජනය**

වියපැහැදම් උපලේඛනය අනුව, රු.මිලියන 10,886 කට සමාන යෙන් මිලියන 8,313 ක් වූ මුළු අරමුදල් 2011 වර්ෂය සිට 2016 දක්වා වර්ෂ 06 ක් ඇතුළත උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබූ අතර 2013 වර්ෂය සඳහා ව්‍යාපෘතියට රු.මිලියන 5,075 ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 4,809 ක් එනම් ප්‍රතිපාදිත අරමුදල්වලින් සියයට 95 ක් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. අරමුදල් උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ලබා දීමට එකඟ වූ මුදල | | **2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපයෝජනය කරන ලද මුදල** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන්යෙන් මිලියන | රු.මිලියන | ජපන්යෙන් මිලියන | රු.මිලියන |
| ජ ජා ස නි | 7,000 | 9,161 | 4,421 | 3,236 | 4,302 | 5,521 | 7,923 |
| ශ්‍රී ලං ර | 1,313 | 1,725 | 654 | 384 | 507 | 576 | 815 |
| **එකතුව** | 8,313 | 10,886 | 5,075 | 3,620 | 4,809 | 6,097 | 8,738 |

**6.2** **භෞතික කාර්යසාධනය**

---------------------

ලැබී ඇති තොරතුරු අනුව ජල ගැලීම් හේතුවෙන් හානියට පත් වූ මාර්ග 149 ක පුනරුත්ථාපන වැඩ (කිලෝමීටර් 329.74) සහ පළාත් තුනක වාරිමාර්ග වැඩ 577 ක් 2013 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. පළාත් වශයෙන් සිදුකරන ලද වැඩවල ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පුනරුත්ථාපන වැඩ | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී නිම කිරීම සඳහා අපේක්ෂිත වැඩ | | | 2013 දෙසැම්බර් 31 දිනට නිම කරන ලද වැඩ | | |
|---|---|---|---|---|---|---|
| | මධ්‍යම පළාත | නැගෙනහිර පළාත | උතුරුමැද පළාත | මධ්‍යම පළාත | නැගෙනහිර පළාත | උතුරුමැද පළාත |
| මාර්ග - ජාතික මාර්ග - සංඛ්‍යාව | 07 | 04 | 08 | 02 | 02 | 06 |
| - කිලෝමීටර් | 24.73 | 21.35 | 46 | 2.5 | 8.35 | 37 |
| පළාත් මාර්ග - සංඛ්‍යාව | 57 | 66 | 35 | 26 | 35 | 33 |
| - කිලෝමීටර් | 94.21 | 98.72 | 101.32 | 29.06 | 28.78 | 95.297 |
| වාරිමාර්ග - විශාල හා මධ්‍යම | | | | | | |
| වාරිමාර්ග වැඩ | - | 217 | 306 | - | 217 | 306 |
| සුළු වාරිමාර්ග වැඩ | - | 34 | 40 | - | 30 | 17 |

2014 ජුනි 30 දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක වැඩබිම් පිළිබඳ විගණන නියැදි පරීක්ෂණයන් සිදු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මනන්කුට්ටිය ජලාශයට ප්‍රවේශ වීමේ මාර්ගයේ සපත්තු පාලම ඉදිකිරීමේ වැඩ රු.7,826,000 කට ඇස්තමේන්තු කර තිබුණද, අදාළ වැඩ රු.4,622,076 ක පිරිවැයකට නිමකර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් වැඩ ආරම්භක අදියරේදී විධිමත් වැඩ ඇස්තමේන්තුවක් නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ස්ථාපිත කරන ලද පාලමේ ස්ථාන 17 ක පිපිරීම් නිරීක්ෂණය වූ හෙයින් වැඩවල ගුණාත්මක තත්ත්වය ඉතා පහළ මට්ටමක විය.

(ආ) මනන්කුට්ටිය ජලාශයේ ජලාපවහන පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. 6,993,000 ක ඇස්තමේන්තු පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. වැඩ සැලැස්ම අනුව, මාර්ග දෙපස නිවාසවලට ප්‍රවේශය සැපයීම සඳහා හියුම් පයිප්ප 100 ක් යොදාගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද ජලාපවහන පද්ධතිය, ආරම්භක වැඩ සැලැස්මට අනුව ඉදිකර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් නිවාසවලට ප්‍රවේශය සැපයීම සඳහා සවිකර තිබූ හියුම් පයිප්ප 96 ක් විධිමත් ලෙස ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) කඩහත ජලාපවහනයේ මීටර් 1200 ක පුනරුත්ථාපන වැඩ අධි ඇස්තමේන්තු කර තිබුණු බවත් කොන්ත්‍රාත් 04 ක් යටතේ ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සියයට 18 සිට සියයට 77 ක් දක්වා අඩු පිරිවැයට ගොවි සංවිධානවලට ප්‍රදානය කර එම වැඩ සිදුකර තිබුණු බවත් නිරීක්ෂණය විය. විගණන පරීක්ෂණයේදී තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදී.

(i) ජලාපවහනය මීටර් 0+00 සිට මීටර් 3+100 දක්වා කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ මීටර් 2+50 දක්වා පමණක් නිම කර තිබුණි. තවද, ජලාපවහන පද්ධතියේ එක් ඇළ මාර්ගයක් පමණක් තිබූ අතර එය කුඹුරුවලට ජලය සැපයීම සඳහා ප්‍රමාණවත් නොවීය.

(ii) මීටර් 3+00 සිට මීටර් 6+00 දක්වා ජලාපවහනය පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව යටතේ පුනරුත්ථාපනය කරන ලද ඇල මාර්ග සහ සපත්තු පාලම හානි වී තිබුණි.

(iii) මාර්ග දෙපස නිවැසියන් විසින් අගලට මායිම්ව අනවසර ඉදිකිරීම් කර තිබීමෙන් ජලාපවහන පද්ධතිය මීටර් 6+00 සිට මීටර් 9+00 දක්වා අවහිර වී තිබුණි.

(ඇ) මාර්ගය දිගට ජලාපවහන පද්ධතිය පුළුල් කිරීම් හා පුනරුත්ථාපනය කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කරන ලද කහටගස්දිගිලිය - කෝන්වැව - දෙමටවැව මාර්ගයේ කිලෝමීටර් 8+540 සිට 8+880 ස්ථානවල මාර්ග උරහිස් සේදී ගොස් තිබුණි.

(ඉ) කිලෝමීටර් 6+976 ස්ථානයේ දැනට පවත්නා පාලම පුනරුත්ථාපනය කළ යුතු වුවද එය 2014 අගෝස්තු 31 වන විටත් සිදුකර නොතිබුණි.